හිතවත් ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු නිපැයුම් /සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සඳහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබඳව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.
ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සඳහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර **පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [**+94(0)114711411**] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

ගිණුම පිළිබඳ විස්තර	ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ	ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු	ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි	ප්‍රධාන නියමයන් සහ කොන්දේසි
විශේෂ ගිණුම්				
නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලසුම මෙය අවම වශයෙන් එක් (01) වසරක සහ උපරිම වශයෙන් වසර පහක (05) ("ඉලක්කගත කාලසීමාව") එකඟ වූ කාල සීමාවක් අවසානයේ දී ගනුදෙනුකරුවකුට ඉලක්කගත මුදල් ප්‍රමාණයක් ලගාකර ගැනීම සඳහා සෑම මසකම ස්ථාවර ඉතුරුම් මුදලක් ("ස්ථාවර මාසික වාරිකය") වෙන් කිරීමට හැකි වන පරිදි නිර්මාණය කර ඇති නිපැයුම්.	ඉලක්කගත කාල සීමාව පුරාවට සහනික පොලී අනුපාතය. ජීවිත රක්ෂණයකට අදාල සුදුසුකම් සම්පූර්ණ කර තිබීමට යටත්ව, එක් ගනුදෙනුකරුවකුට උපරිමය රුපියල් මිලියන 2ක් දක්වා නොමිලේ ජීවිත ආවරණයක්.	ගිණුමක් නිසි කාලය එළඹීමට පෙර වසා දමන අවස්ථාවේදී පහත සඳහන් පොලී අනුපාතය පරිදි දඩ ගාස්තුවක් අය කෙරේ: එක් වසරක් සම්පූර්ණ වීමට පෙර ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය වසර 2 පසුව ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය සහ 1% ක්	නිසි පරිදි සම්පූර්ණ කරන ලද නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලැසුම් ගිණුමක් විවෘත කිරීමේ පෝරමය. • ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක් • ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනය, පදිංචි ලිපිනයෙන් වෙනස් නම් ලිපින තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.	සුදුසුකම් ලබන පුද්ගලයින්: වලංගු ජාතික හැඳුනුම්පතක් /විදෙස් ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි සහ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් · අවම ශේෂයක් පිළිබඳ අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත්, ගනුදෙනුකරුට සම්පූර්ණ ඉලක්කගත මුදල සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි ස්ථාවර මාසික වාරිකය අඛණ්ඩව තැන්පත් කළ යුතුය.ද බැංකුව විසින් ලබා දී ඇති කලින් තීරණය කරන ලද ආයෝජන සැලැස්මේ ගෙවීම් කාලසටහනේ ඉලක්කගත මුදල ගනුදෙනුකරුගේ අභිමතය පරිදි තීරණය කළ හැකි නමුත් තැන්පත් කරනු ලබන මාසික වාරිකය එසේ තීරණය කළ නොහැක. ඉලක්කගත මුදල අදාළ වන අවස්ථාවන් වලදී රජයේ බදුවලට යටත් වේ. නේෂන්ස් ළමා (Nations Kidz) ආයෝජන සැලැස්ම යටතේ සහ පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුම යටතේ ගනුදෙනුකරුට රක්ෂණ ආවරණයක් නිකුත් කර ඇත්නම්, ගනුදෙනුකරුගේ අභාවයේදී ගෙවිය යුතු උපරිම රක්ෂිත මුදල වන්නේ රුපියල් 2,000,000 කි.

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලසුමට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසි **https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf** හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.
- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, මෙහි ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.